**සීතාවකපුර නගර සභාව - 2021**
----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
-------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

සීතාවකපුර නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.3,098,533 කින් වැඩියෙන් දක්වා තිබුණි. නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩපහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදානයට අදාලව දරන ලද සත්‍ය වියදම රු.7,392,186ක් වෙනුවට රු.7,500,000ක් ලෙස ගිණුම්ගත කිරීම සහ 2020 වර්ෂයේදී ලද රු.2,990,718ක් වූ ප්‍රාග්ධන ප්‍රදානය 2021 වර්ෂයේදී ලද ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබුණි. | වර්ෂය තුළ ලැබුණු සියළුම ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එම වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස ආදායමට නොගන්නා අතර ලැබුණු සියළුම ප්‍රාග්ධන වියදම් ප්‍රදාන අයභාර ආදායමක් ලෙස වර්තමාන ගිණුම් ප්‍රමිත අනුව හඳුනා නොගනී. එම නිසා මෙම වර්ෂයේ ලැබුණු සම්පූර්ණ ප්‍රාග්ධන වියදම් ප්‍රදානයේ වටිනාකම වූ රු.14,002,089 අයභාරයට ගත නොහැකිය. | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. |
| (ආ) | 2020 වර්ෂයේදී පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම්වල වටිනාකම රු.35,066,521ට අදාළව 2021 වර්ෂයේදී ක්‍රමක්ෂය කළ යුතු වටිනාකම රු.3,506,652ක් වුවත් රු.1,905,642 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ අයභාරය රු.1,601,010 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබ විසින් දක්වා ඇති පුනරාවර්තන නොවන වියදම් සඳහා වටිනාකම රු. 3,505,652 ශේෂ පිරික්සුම අනුව සොයාගත නොහැක. කෙසේ වෙතත් වර්තමාන ගිණුම් ප්‍රමිත අනුව අප විසින් දක්වා ඇති මුදල නිවැරදි බව වාර්තා කරමි. | වර්ෂයට අදාල ක්‍රමක්ෂය නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.109,647 ක් වැඩියෙන්ද තවත් ස්ථාවර වත්කම් විෂයයන් 06ක ක්ෂය වටිනාකම එකතුව රු.776,117 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ක්ෂය කිරිම් නියමිත පරිදි හීනවන ශේෂ ක්‍රමයට ගණනය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ක්ෂය කිරීම් නිවැරදිව ගණනය කල යුතුවේ. |
| (ඈ) | පුස්තකාල පොත් ක්ෂය වටිනාකම රු.651,985 ක් වුවද, රු.724,428 ක් ලෙස දැක්වීමෙන් රු.72,443ක් වැඩියෙන් දක්වා තිබුණි. නගර සභාව අනුගමනය කරන ක්ෂය ක්‍රමය හීනවන ශේෂ ක්‍රමය වුවත් පුස්තකාල පොත් ක්ෂය කිරීමේදී එම ප්‍රතිපත්තිය අනුගමනය කර නොතිබුණි. | එකඟ වේ. 2022 වර්ෂයේ ජනල් සටහන් අංක 02 මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. | ක්ෂය කිරීම් නිවැරදිව ගණනය කල යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල රු.7,881,460 ක් වටිනා වාහන 07 ක් විකුණා තිබුණු අතර එම වාහනවල ක්ෂය වටිනාකම රු.445,106 කි. එම වාහන විකිණීමෙන් රු.1,967,468 ක් සභාවට ලැබී තිබුණු අතර මෙම ගනුදෙනුවල ලාභය හෝ පාඩුව ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ලාභ පාඩු ගණනය කර පෙන්නුම් නොකළ ද එමගින් සිදු වූ ශුද්ධ ප්‍රතිඵලය වත්කම් හා වගකීම් ගිණුම් වල නිවැරදිව සටහන් කර ඇත. එම නිසා මෙම ගනුදෙනු වල සිදු වූ ලාභ හා පාඩු වෙනම ගණනය කර යළි නිවැරදි කිරීමෙන් සටහන් යෙදීම අවශ්‍ය නොවේ. | වාහන විකිණීමෙන් ලද ලාභය හෝ පාඩුව ගණනය කර ගිණුම්ගත කල යුතුවේ. |
| (ඊ) | වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.222,794 ක් හා ලැබිය යුතු පොලී ආදායම රු.129,546 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව ගණනය කල යුතුවේ. |
| (උ) | ලංකා බැංකුවේ බැංකු ගිණුමේ සංශෝධිත මුදල් ශේෂය රු.14,222,200ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.13,764,780 ක් ලෙස සංශෝධනයන්ට පෙර මුදල් ශේෂය සටහන් කිරීමෙන් මුදල් ශේෂය රු.457,420 ක් අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් දෙසැම්බර් මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය ලෙස රු.360,000 ක්ද, ස්ථාවර තැන්පතු පොළිය රු.92,466 ක් හා සෘජු ලැබීම් රු.4,954 ක් ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මන්ත්‍රී දීමනා වර්ෂයට අදාල ආදායම නිවැරදිව ආදායම් ගිණුමේ සටහන් කර ඇත. එහෙත් 2021 දෙසැම්බර් මස ලැබිය යුතු මන්ත්‍රී දීමනා නිවැරදිව සටහන් නොකිරීම නිසා මෙම මන්ත්‍රී දීමනා ආදායමට නොව සමුච්චිත අරමුදලට බැරකල යුතුව ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි මුදල් ශේෂය දැක්විය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | නාගරික සංවර්ධන අරමුදල් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 153,137 ක් අඩුවෙන් දක්වා තිබුණි. | හිඟ හිට් පොළිය ගිණුම්ගත නොකිරීම නිසා මෙම වෙනස ඇති වී ඇති අතර 2022 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත යුතුවේ. |
| (එ) | ගබඩා තොග වටිනාකම තුළ රු.770,973 ක් වූ ආයුර්වේද තොග ශේෂය දෙවරක් ඇතුළත් කර තිබීමෙන් සමස්ථ තොග ශේෂය රු.770,973 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණ හා එකඟවෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි ශේෂයන් දැක්විය යුතුවේ. |
| (ඒ) | 2021 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.695,810 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ පුනරාවර්තන වියදම් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සහ දේපළ, පිරියත හා උපකරණ එම වටිනාකමෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය සමඟ සසඳා ද්විගණනයක් නොවන පරිදි නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | වර්ෂයේ මිලට ගැනීම් නිවැරදිව සටහන් කල යුතුවේ. |

### 1.6.2 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ලද වාහන හා පුස්තකාල පොත් පරිත්‍යාග රු.3,569,735 ක් ද, ණයහිමි පදනම යටතේ මිලට ගත් යන්ත්‍ර, පුස්තකාල පොත් සහ ඉදිකරන ලද පාරවල් පාලම් බෝක්කු රු.2,437,163 ක් ලෙස මුළු එකතුව රු.6,006,898 ක් දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම් යටතේ අඩුකර දක්වා තිබීම හේතුවෙන් සමලෝචිත වර්ෂයට අදාළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය රු.6,006,898 ක් අඩුවෙන් දක්වා තිබුණ අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය රු.2,273,138 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. විස්තීරණ ආදායම් ප්‍රකාශය වත්කම් වගකීම් ප්‍රකාශය ස්කන්ධයට මෙමගින් කිසිදු බලපෑමක් සිදුවී නොමැති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් සිදු කරනු ලබන්නේ අමතර තොරතුරු දැන්වීමක් පමණි. එම නිසා ද්විත්ව සටහන් න්‍යායට මෙම ප්‍රකාශය ඇතුලත් නොවේ. | මුදල් ප්‍රවාහය නිවැරදිව දැක්විය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.7,403,556 මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රමාණය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් දීමනා ලෙස රු.1,905,642 ක් අඩුකර දැක්විය යුතු වුවද හඳුනාගත් ප්‍රාග්ධන වියදම් දීමනා ලෙස රු.3,302,462ක් එකතු කර තිබුණි. | එම | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි අගයන් දැක්විය යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03ක ගිණුම අනුව ශේෂය රු.54,606,738 ක් වුවත්, ඊට අදාල උපලේඛන / උපයෝගී ලේඛන අනුව එක් ගිණුමක ශේෂය රු.750,415ක් වැඩියෙන්ද අනෙක් ගිණුම් දෙකෙහි ශේෂය රු.242,838ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | මේ පිළිබඳව සොයා බලා 2022 මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කල යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් දීමනා ලෙස රු.3,302,462ක් අඩුකර ඇතත් එම වටිනාකම ගණනය කළ ආකාරය පැහැදිලි නොකෙරුණි. | ප්‍රාග්ධන වියදම් දීමනා වටිනාකම ගණනය කළ ආකාරය | මෙම මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් දිමනා බව තහවුරු කරමි. | නිවැරදි වටිනාකම් ගණනය කළ ආකාරය ඉදිරිපත් කළ යුතුවේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.6,108,952 ක් වූ ආදායම් වෙනුවෙන් තැන්පතු ශේෂය සනාථ කර ගැනීම | ආදායම් තැන්පතු සහතික හා විස්තරාත්මක උපලේඛන | විශේෂ අවධානයක් යොමු කරමින් 2022 වර්ෂයේ අවසාන වීමට ප්‍රථම නිවැරදි කිරීමට | විගණන සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

| | |
|---|---|
| සඳහා විගණන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. තවද දේපළ, පිරියත හා උපකරණ සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 8,036,784ක ප්‍රාග්ධන වියදම් සඳහා ණයහිමි වෙන්කිරීම්, අදාළ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබේද යන්න සනාථ කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | කටයුතු කරමි. මෙම ස්ථාවර වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන සඳහා නිවැරදිව ලබාගෙන ඇති අතර ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමේදී යම්කිසි අතපසුවීමක් සිදු වී ඇත. |

**1.7 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (අ) ඡේදය | තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද 2007 වර්ෂයේ සිට පවතින රු.584,289 ක් වටිනා අත්තිකාරම් පියවීමට කටයුතු නොකර 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හා වෙන්කිරීමේ ගිණුමට මාරු කර තිබුණි. | ගිණුම්කරණ සිද්ධාන්ත අනුව ඒ සඳහා වෙන් කිරිමක් සිදු කර සංචිත හා වෙන් කිරීමේ ගිණුමට මාරු කර කපා හැරිමක් සිදු කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් චක්‍රලේඛය | පළාත් පාලන ආයතනවල නාගරික සංවර්ධනය සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමේ ප්‍රමාණවත් මුදල් එකතු වූ විට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත හඳුනාගත් ව්‍යාපෘතිය සඳහා යෙදවිය යුතු වුවත් 2022 අප්‍රේල් 08 දිනය වන තෙක්ම එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | නගර සභාව මගින් කසල දාහකයක් ස්ථාපිත කිරීම සඳහා පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් අක්කර 05 කින් යුතු “ෆාන්හැම්වත්ත” ඉඩම මිලදී ගැනීමට තීරණය කර ඇත. ඒ සඳහා එම මුදල් යොදවා ගැනීමට 2020/07/17 දින මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර එය සභා සම්මත වී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම් ඉක්ම වූ අයභාරය, රු.32,239,839 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන ආදායම ඉක්ම වූ වියදම රු. 49,323,906ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.17,084,067 කින් පිරිහී තිබුණි.

2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ සමස්ත බිල් කළ ආදායම් එකතුව රු.88,772,344 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.53,741,774 ක් විය. 2021 වර්ෂයේදී රැස්කළ මුළු ආදායම රු.43,505,460 ක් වූ අතර ඊට සාපේක්ෂව වර්ෂය අවසානයේ මුළු හිඟය සියයට 130 කින් වැඩි වී තිබුණි. | රටේ පැවති කොරෝනා ව්‍යාප්තිය සමඟ රට වරින් වර අවස්ථා ගණනාවකදී වැසීමට සිදු විය. මෙහිදී සියලු නිලධාරීන් සේවයට වාර්තා කිරීම සිදු වූයේ ද, සේවා මුර ක්‍රමයටයි. මෙහිදී දේපල සඳහා ප්‍රවේශ වීමේදී අදාල දේපල නිරෝධානය කර තිබීම, ආදායම් අංශයේ සේවය කරන නිලධාරීන් ස්වයං නිරෝධායනයට යොමු වීම වැනි නොයෙක් දුෂ්කරතා මත අප මෙතෙක් කලක් ක්‍රමවත්ව පවත්වාගෙන ආ හිඟ ආදායම් හා ප්‍රවර්ථන ආදායම් එක් රැස් කිරීම මන්දගාමී තත්ත්වයකට ඇද වැටුනද, නැවත මෙම තත්ත්වයෙන් මිදී පෙර තත්වයට ක්‍රමයෙන් අවතීර්ණ වී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කඩකුලී** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු.3,036,064 ක් වූ අතර මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තව දුරටත් පවතින හිඟ ශේෂය මේ වන විට ගිවිසුම් ප්‍රකාරව කඩ හිමියන් වෙත ලිපි නිකුත් කරමින්, කඩ හිමියන්ගෙන් අදාල හිඟ කඩකුලී මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) ටෙන්ඩර් කඩකුලී

--------------------

| | | |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට ටෙන්ඩර්කරුවන් 05 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින ටෙන්ඩර් කඩ කුලී ශේෂය රු.62,570ක් විය. එම කාලවකවානුවේදී එම ටෙන්ඩර්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව මෙම කඩ, කුලියට ලබා දී ඇති බැවින් මෙම ටෙන්ඩර් කඩ කුලී ශේෂය අයකරගත නොහැකිව පැවතුණි. | මෙම කඩ කාමරයන්ට අදාලව ගිවිසුම්ගත වීමක් ගොනුව තුල දක්නට නොලැබුණි. ඇතැම් ටෙන්ඩර් කඩයන්හි ගිවිසුම්ගත වීමක් තිබුනද මාසික කුලිය ගෙවීමට ප්‍රසම්පාදන කරු අපොහොසත් වුවහොත් හිඟ මුදල අයකර ගැනීමට ගිවිසුමේ කොන්දේසි නොමැති බවද තහවුරු විය. එහෙයින් මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) තානායම් කුලිය

------------------

| | | |
|---|---|---|
| අවිස්සාවේල්ල තානායම 2020 මැයි සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා පෞද්ගලික ආයතනයකට බදු දීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු හිඟ තානායම් කුලිය රු.4,267,885 ක් විය. | අදාල ආයතනය වෙත 2020 වර්ෂයේ Covid වසංගතය වෙනුවෙන් සහන ලෙස 2020 මාර්තු/අප්‍රේල්/මැයි මාස සඳහා මාසික කුලියෙන් අඩක සහන ලබා දී ඇත. එකී සහන ලබා දිම මගින් ද අප පළාත් පාලන ආයතනය අපේක්ෂා කරන ලද්දේ තානායම මගින් අප පළාත් පාලන ආයතනයට අය විය යුතු මාසික කුලිය හිඟයකින් තොරව අයකර ගැනීමේ අපේක්ෂාවයි. | හිඟ තානායම් කුලි අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඉ) පෞද්ගලික බස් ගාල් ගාස්තු

--------------------------------

| | | |
|---|---|---|
| 1989 වර්ෂයේ සිට අයවිය යුතු පෞද්ගලික බස්ගාල් ගාස්තු වටිනාකම රු.230,700ක් විය. | අදහස් දක්වා නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඊ) විනෝද බදු

-------------

| | | |
|---|---|---|
| රු.516,862ක් වටිනා විනෝද බදු වටිනාකම 2021 අප්‍රේල් විගණිත දින වන විටද නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **පිලිප් ගුණවර්ධන ක්‍රීඩාංගණයේ පදික මං තිරුවක් ඉදිකිරීම** | | |
| සභාව විසින් කර්මාන්ත සැලසුම් නිසි පරිදි කළමනාකරණය නොකිරීම මත සභාවේ එක් කර්මාන්තයක් ඇණ හිටිම හේතුවෙන් රු.305,979 ක නිශ්ඵල වියදමක් දැරීමට සිදුවී තිබුණි. | ඉහත ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්කරු විසින් එම ස්ථානය වෙත සපයා තිබූ ගල් 4200ක ප්‍රමාණය නගර සභාවේ ගබඩාව වෙත බාරදී ඇත. මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක නොවන බැවින් එම ගල් ප්‍රමාණය සභා භූමිය තුළ ඇල්ලීමට යෝජිතව ඇත. | සභාවේ මුදල් ඵලදායී කටයුතුවල යෙදවිය යුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | **ලංකා බැංකු ගොඩනැගිල්ල පිහිටි භූමිය බදු දීම** | | |
| | සීතාවකපුර නගර සභාව විසින් 1989 ජුනි 09 දිනැති අංක 248/334 දරන ගිවිසුම ප්‍රකාරව 1988 ජුලි 01 දින සිට 2018 ජුනි 30 දක්වා වසර 30 ක කාලයකට සභාව සතු භූමියක් ලංකා බැංකුව වෙත බදු දී තිබුණි. මෙම බදු කාල සීමාව අවසන් වන විට නැවතත් බදු කාලය දීර්ඝ කර දෙන ලෙස බැංකුව විසින් 2017 වර්ෂයේදී සභාවෙන් කරන ලද ඉල්ලීමට අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරුවට යටත්ව බදු කාලය දීර්ඝ කිරීමට සභාව එකග වී තිබුණි. නව තක්සේරුවට ප්‍රථම ලංකා බැංකුව විසින් වාර්ෂික බදු කුලිය හා ඊට අදාල වැට් බදු මුදල ලෙස රු.475,000 ක් ගෙවා තිබුණි. රු.475,000 ක් සහ ඊට අදාල වැට් බදු නව තක්සේරුව අනුව බැංකුව විසින් සභාවට ගෙවිය යුතු වාර්ෂික බදු කුලිය සහ ඊට අදාල වැට් බදු මුදල රු.5,700,000 ක් විය. | (i) අදාල මාසික කුලිය අයකර ගැනීම සඳහා අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු අංක L29081/19 යටතේ නඩුකරය පවරමින් අදාල ගාස්තුව අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.<br><br>(ii) ගිවිසුම් ප්‍රකාරව නැවත අදාල පාර්ශ්වය සඳහා බදු ලබා දීම සඳහා ගිවිසුමේ ප්‍රතිපාදන ලැබී ඇති බැවින් ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලබා ගැනීම සිදු කරනු ලැබීය. නමුත් අදාල මාසික කුලිය නොගෙවීම සහ ගිවිසුම්ගත | පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කර සමථයකට එළඹ හිඟ බදු කුලිය අයකර යුතුවේ. |

මෙම නව බදු කුලිය ලංකා බැංකුව විසින් ගෙවීමට එකඟ නොවීම මත නගර සභාව විසින් අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. ගොඩනැගිල්ලේ නව වාර්ෂික තක්සේරු කුලිය වන රු.5,700,000 මුදල් සභාවට නොගෙවා එම ගොඩනැගිල්ල භාවිතා කරමින් පැවතුණි.
මෙම නඩුව 2022 අප්‍රේල් 18 විගණිත දින දක්වා සමථයකට පත්වී නොතිබුණ අතර 2018 ජුලි 01 දින සිට 2021දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු තක්සේරු බදු කුලී වටිනාකම වන රු.19,475,000ක මුදල සභාවට ලැබී නොතිබුණි.

නොවීම මත මෙම අවිස්සාවේල්ල අධිකරණයේ නඩු පවරා ඇත.

(iii) ලංකා බැංකුව සමඟ නගර සභාව විසින් සාකච්ඡා වාර කිහිපයක් පවත්වා ඇති බව සඳහන් කරමි. 2021.10.18 වන දින පළාත් පාලන අමාත්‍යාංශයේ දී ලංකා බැංකුව සමඟ සාකච්ඡා පැවැත් වුවද අදාල පාර්ශව දෙක සාකච්ඡා කර විසඳා ගන්නා ලෙසට එහිදී තීරණය විය. ඒ අනුව අදාල පාර්ශ්වය සමඟ සාකච්ඡා කලද අදාල තත්ත්වය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට අවතීර්ණ නොවීය.

(ආ) වැවේ කැලේ පාරිසරික සංචාරක ස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය
--------------------------------------------

අක්කර 27 ක් පමණ වූ භූමි භාගයක පිහිටා ඇති වැවේ කැලේ පාරිසරික සංචාරක ස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.11,360,000ක් වැය කර තිබුණ අතර 2018 වර්ෂයේදී රු. 4,503,193ක ඇස්තමේන්තු සකස් කරමින් එම භූමියේ ඇති පැරණි ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉවත්කර එම ස්ථානයේ තෙමහල් ගොඩනැගිල්ලක් සකස් කිරීමටද සැලසුම් කර තිබුණි. එහෙත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට පෙර එම භූමියේ නිත්‍ය අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සභාව සතු කරගෙන නොතිබුණි.

වැවේ කැලේ පවරා ගැනීම සඳහා වරින් වර එක් එක් ආයතනයන් වෙත ලිපි ඉදිරිපත් කර ඇති අතර අවසාන වශයෙන් ප්‍රධාන ලේකම් (බ.ප) ගේ අංක CSWP/ADM/16-19/F1/01-01(A) හා 2021.12.30 දිනැති ලිපිය මගින් මෙම පවරා දීම සම්බන්ධව ප්‍රාදේශිය ලේකම්ගේ ස්ථාවරය දන්වන ලෙස ලිපියක් යොමු කර ඇත. එම ලිපියට අවධානය යොමු කරමින් මාගේ අංක සීනස/01/02/73 හා 2022.03.30 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ගය සම්බන්ධව දැනුවත් කරන ලෙස ලිපියක්ද යොමු කර ඇත.

අදාල භූමියේ අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීතාවකපුර නගර සභාව සතුව නිල නිවාස 07 ක් පවතින අතර එහි නිලධාරින් / සේවකයින් 07 දෙනෙකු පදිංචිව ඇත. ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 6:1 වගන්තියට අනුව 4, 3 හා 2 ශ්‍රේණිවලට අයත් නිවාසවල සාමාන්‍ය බදු කාලය වර්ෂ 05 ක් වුවද, උක්ත සේවකයන් අවුරුදු 25 කට වැඩි කාලයක් අඛණ්ඩව පදිංචිව සිටී. තවද මෙම නිවාසය තුළ අනවසර ඉදිකිරීම් කර ඇති බව සහ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන බවත් නිරීක්ෂණය විය. ආයතන සංග්‍රහයේ XVIII වගන්තියේ 5 වෙනි ඡේදයට අනුව රජයේ නිල නිවාසයන් භුක්ති විඳින නිලධාරියෙකු තම කාලය ඉක්මවා නිවාසයක පදිංචි වීම මත දණ්ඩන කුලියක් අයකර ගත හැකි බවත්, 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන පනත මඟින් රජයේ නිවාස සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් හෝ අදාල ආයතන ප්‍රධානියාට මෙම පනත යටතේ ක්‍රියාත්මක වීමට බලය ලබා දී ඇති බව නිරීක්ෂණය කෙරේ. එහෙත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සීතාවකපුර නගර සභාව සතු නිල නිවාස 07හි පදිංචිව සිටින සේවකයින් ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.1 අනුව වසර 05කට වඩා වැඩි කාලයක් පදිංචිව සිටීම මත ඔවුන්ට 1978 අංක 42 දරන නිල නිවාස සන්තකය පවරා ගැනීමේ පනත අනුව අස්කිරීමේ නිවේදන ලබා දී ඇත.<br>ගිවිසුම්ගත කාලය ඉක්මවා නිල නිවාසවල ඔවුන් පදිංචිව සිටීම නිසා 2021 ජූනි මස සිට 2022 අප්‍රේල් මස දක්වා විවෘත වෙළඳපල කුලිය ප්‍රධාන තක්සේරුකරු විසින් වාර්තා කර වාර්තා ලබාගන්නා තෙක් දණ්ඩන කුලියෙන් කොටසක් වන වැටුපෙන් 8% අයකර ගන්නා ලදී. | ආයතන සංග්‍රහය සහ අදාල පනත් අනුව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවේ සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර ඉදි කිරීම සඳහා සභාව විසින් රු.22,211,213 ක් වැයකර තිබුණි. ඉහළ මහලේ කඩ කාමර 106ක් නිමකිරීමට සැලසුම් කර ඇතත් වැඩ නිමකර ඇති කාමර සංඛ්‍යාව 56 කි. මෙම කඩ කාමර 56න් කඩ 28ක් වසා දමා තිබූ අතර ඉහළ මහලේ එක් කොටසක ඉදිකළ යුතු කඩ කාමර 34 කට අදාලව මෙතෙක් කඩ කාමර ඉදිකර නොමැතිවීම හේතුවෙන් එහි ස්ලැබ් එක දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | බස් නැවතුම්පල ඉහළ මහලේ ඉදිකළයුතු කඩ කාමර 34 සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතින අතර මෙම වර්ෂය තුළ ඉදිකිරීම් ආරම්භ කිරීමට යෝජිතයි. | සභා දේපළ නිෂ්ක්‍රීයව තබා නොගෙන ඵලදායී කටයුතු සඳහා යොමු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී රු.7,389,200ක වටිනාකමකට අගය කරනු ලැබූ රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ පරිත්‍යාග කරන ලද වයිබ්‍රේටින් රෝලර් යන්ත්‍රය විගණිත දිනය වන 2021 දෙසැම්බර් 03 වන විටද භාවිතයට නොගෙන සභා භූමිය තුළ ගාල් කර තිබුණි. | 2022.01.11 දින පැවති මාසික මහ සභාවේ අංක 5.12 දරණ තීරණය අනුව මෙම U ටොන් 08 මාර්ග තලනය පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවට ලබා දීමට එකඟ වූ බව ලිඛිතව පළාත් පාලන දෙපාර්තමේන්තුවට හා පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවට දැනුම් දී ඇති අතර මේ වන තෙක් පිළිතුරක් ලබා දී නොමැත. | සභාවේ අවශ්‍යතාවය හා ධාරිතාවය මත වත්කම් ලබා ගත යුතුවේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අපහරණය සඳහා නිර්දේශිත ත්‍රිරෝද රථය විගණිත දින වන 2022 අප්‍රේල් 08 වන දින විටද අපහරණයට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | අළුත්වැඩියා තත්ත්වයේ පවතින වාහන 06ක් පැවති අතර විගණිත දින වන 2022 අප්‍රේල් 08 වැනි දින වන විටද අළුත්වැඩියා කර නොතිබුණි. | එම | අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | ධාවනයට රියදුරන් නොමැති වීම හේතුවෙන් වාහන දෙකක් ධාවනයේ යොදවා නොතිබුණි. | එම | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ.. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීතාවකපුර කර්මාන්ත පුරයෙන් සිදුවන පරිසර හානිය | | |
| සීතාවකපුර නගර මධ්‍යයට යාබදව පෞද්ගලික සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්තපුරයේ අවිධිමත් හා නොසැලකිලිමත් කටයුතුවලින් එහි ආසන්නයේ ජීවත්වන වෙරළුපිටිය | මා විසින් මෑතකදී කිප අවස්ථාවකදීම ජලය පිරිපහදු ටැංකියෙන් අපවිත්‍ර ජලය ගලායන සඳහන් ඇල මාර්ගය පරීක්ෂා කළ මුත් එය අවර්නව පැහැදිලිව තිබුණි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | පරිසර හානි වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

ගම්වාසීන්ට විශාල පරිසර හානියක් සිදුවන බව නිරීක්ණය විය. ඒ අනුව අපවිත්‍ර ජලය ගඟට එකතු වීම, අපවිත්‍ර ජලය නිසා පුවක්පිටිය යටවීම, වාහන විෂදුම හා ශබ්ද නිසා ගම්වාසීන් රෝගාතුර වීම, අපද්‍රව්‍ය බීමට ගන්නා ජලයට එක්වීම යන ආදී පාරිසරික ගැටළු රැසක් පැවතී බව නිරීක්ෂණය විය.

කාර්යාලය සමඟ සම්බන්ධවී එම ස්ථානයේ ජල සාම්පල් ගැනීමට කටයුතු කරමින් සිටී.